# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**ශිල්ප කලා - I** | **11 ශ්‍රේණිය** | **කාලය පැය එකකි**

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයක් සටහන් කරන්න.
- පළමු කොටසට ලකුණු 40යි.

(01) රංගනය, ගායනය, නැටුම, මූර්ති යන මාධ්‍ය ඔස්සේ සෞන්දර්ය රසවින්දනය කළ අතර මෙම කලාව අප හඳුන්වන්නේ කුමන නමකින්ද?

(1) සිව්සැට කලාව ලෙසය. (2) ජන කලාව ලෙසය. (3) විදග්ධ කලාව ලෙසය. (4) ශිල්ප කලාව ලෙසය.

(02) පේෂ කර්මාන්තයේදී රෙදි නිෂ්පාදනයට භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය වන්නේ,

(1) ඛනිජ වර්ග ය. (2) තෙල් වර්ගය. (3) කෙඳි වර්ගය (4) වැලි වර්ගය

(03) විවිධ ශාන්තිකර්ම සඳහා වෙස්මුහුණු භාවිතා කරයි. දහ අට සන්නිය, දොළහ පාලිය ආදී ශාන්තිකර්ම සඳහා භාවිතා කරන වෙස්මුහුණු වර්ගය වන්නේ,

(1) යක් නැටුම් වෙස්මුහුණු (2) කෝලම් නැටුම් වෙස් මුහුණු
(3) සන්නි නැටුම් වෙස්මුහුණු (4) ගැමි නැටුම් වෙස්මුහුණු

(04) සිරස වෘත්තාකාරද, දෙපස සිරස් ආකාරයටද පතුල වෘත්තාකාරද වශයෙන් දක්වමින් ජ්‍යාමිතික නිර්මාණයක් විස්තර කර තිබුණි. මෙය කුමන ජ්‍යාමිතියට අයත් රූප සටහනක්ද?

(1) තල ඝන ජ්‍යාමිතියට (2) තල ජ්‍යාමිතියට (3) ඝන ජ්‍යාමිතියට (4) තල රූප ජ්‍යාමිතියට

(05)



මෙම රූප සටහන සම්මත රේඛා කිහිපයක් එක්ව සැදී ඇත. එහි දැකිය හැකි සම්මත රේඛා ගණන වන්නේ,

(1) 6 යි. (2) 4 කි. (3) 5 කි. (4) 7 කි.

(06) වෘත්තය ආශ්‍රිතව විවිධ නිර්මාණ කළ හැකිය. පහත නිර්මාණයෙන් දැක්වෙන වෘත්ත කොටස් කුමන නමකින් හැඳින්වේද?



(1) වෘත්ත පාදයයි.
(2) වෘත්ත ඛණ්ඩයයි.
(3) අර්ධ වෘත්තයයි
(4) කේන්ද්‍රික ඛණ්ඩයයි

(07) කෝණ නිර්මාණය සඳහා විවිධ ක්‍රම භාවිතා කරයි. සුළු කෝණයක හා මහා කෝණයක අගයන් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A. $30^0$ - $105^0$ B. $90^0$ - $180^0$ C. $60^0$ - $120^0$ D. $10^0$ - $180^0$

(1) A හා C ය (2) B හා C ය. (3) C හා D ය (4) ඉහත සියල්ලම

(08) එක් එක් බහු අස්‍ර වලට අදාළ පාද සංඛ්‍යාව අනුව බහු අස්‍ර වර්ග කෙරේ. පහත නිර්මාණයේ බහු අස්‍ර කීයක් දැකිය හැකිද?



(1) 3 කි. (2) 4 කි.
(3) 5 කි. (4) 6 කි

(09) පහත රූප සටහනින් දක්වා ඇත්තේ කුමන නිර්මාණයක් සකස් කිරීමද?



(1) ඩේලියා මල් පෙති සැකසීම ය. (2) ඉඳි කටු රඳවනය සැකසීමය
(3) මේස දරණු සැකසීමය (4) බඳුන් පලස සැකසීමය.

(10) ඉහත දැක්වෙන බෝනික්කා නිර්මාණය කිරීමට යොදා ගෙන ඇති හැඩතලය කුමක්ද?

(1) සිලින්ඩරය
(2) ප්‍රිස්මය
(3) කේතුව
(4) පිරමීඩය



(11) ඉලිප්සය ඇඳීමට යොදා ගන්නා විවිධ ක්‍රම පහත දැක්වේ. මින් ඉලිප්සය ඇඳීමට යොදා ගන්නා ක්‍රමයක් නොවන්නේ,

(1) චාප ක්‍රමය (2) පංචාශ්‍රක්‍රමය (3) ඒක කේන්ද්‍රික වෘත්ත ක්‍රමය (4) ඍජුකෝණාස්‍ර ක්‍රමය

(12) විහාර බිතු සිතුවම් නිර්මාණයේදී පරිසරයේ ඇති අමුද්‍රව්‍ය භාවිත කර ඇත. කහ වර්ණය ලබා ගැනීමට භාවිතා කරගත් අමු ද්‍රව්‍යයකි.

(1) මකුළු මැටිය (2) සාදිලිංගම් ය. (3) ගොකටු ගසේ කිරි ය. (4) අඳුන් දූලිය

(13) පෙර පිරියම් ක්‍රම කිහිපයකි. අමු රෙදිවල පවතින දුඹුරු පැහැය ඉවත් කර සුදු පැහැය ලබා ගැනීම සඳහා සිදු කරන්නා වූ රසායනික ක්‍රියාවලිය වන්නේ,

(1) විරංජනය (2) කැඳහරණය (3) මළහරණය (4) කාබනීකරණය

(14) රෙදි පිළි අලංකරණයේදී ස්ථිර අච්චු සකස් කිරීමට භාවිත කරන ලීයක තිබිය යුතු ගුණාංගයකි.

(1) ශක්තිමත් දැව වර්ගයක් වීම.
(2) පහසුවෙන් කැපිය හැකි මෘදු දැව වර්ගයක් වීම.
(3) වර්ණවලට ඔරොත්තු නොදීමේ හැකියාව
(4) දැව වර්ගය පිපිරෙන සුළු වීම.

(15) දිළිසෙන ස්වභාවයෙන් යුක්ත රුවල් රෙදි නැව්, කඹ ආදිය සෑදීමට යොදා ගනු ලබන ශාක වර්ගයකි.

(1) මැනිලා (2) රැමී (3) පෙනා (4) නියඳ

(16) ලෝම ලබාගත හැකි සත්ත්ව වර්ග කිහිපයකි. ඇල්පකාගේ ලෝම සමග මිශ්‍ර කොට රෙදි වියා ගැනීමට ලෝම ලබා ගන්නා සතෙකි.

(1) විකුණාය (2) ඇංගෝරා එළුවාය. (3) ඔටුවා ය. (4) ලාමා ය.

(17) තිර රාමු මුද්‍රණයේදී තිර රාමුව සකස් කර ගැනීම සඳහා වෙළඳපළින් ලබා ගත හැකි විශේෂිත රෙදි වර්ගය මොනවාද?

(1) කපු රෙදි (2) රැන්ග්ලර් රෙදි (3) නයිලෝන් රෙදි (4) බෝල්ටින් ක්ලෝත්

(18) රෙදි පිළි අලංකාර කිරීම සඳහා බතික් කිරීම ද යොදාගනී. බතික් කිරීම සඳහා යොදා නොගන්නා සායම් වර්ගයකි,

(1) ප්‍රෝෂියන් සායම් (2) දිය සායම් (3) බ්‍රෙන්තෝල් සායම් (4) නැප්තෝල් සායම්

(19) රෙදි වල මූලික කෙඳි ප්‍රභවය හඳුනා ගැනීම සඳහා සරල පරීක්ෂණ ක්‍රම කිහිපයක් භාවිත කෙරේ. නූලක සිරස් පෙනුම හා තිරස් පෙනුම අනුව යොදා ගන්නා හඳුනා ගැනීමේ පරීක්ෂණය කුමක්ද?

(1) පැල්ලම් පරීක්ෂාව (2) පිළිස්සුම් පරීක්ෂාව (3) අන්වීක්ෂ පරීක්ෂාව (4) ස්පර්ශ කිරීමේ පරීක්ෂාව

(20) පහත දැක්වෙන්නේ එකම රටාවේ ප්‍රභේද වලින් වියන ලද බඳුන් පලස් කිහිපයකි. මෙහි දික්දාර වියමන ඇතුලත් බඳුන් පලස තෝරන්න.



(i) (ii) (iii) (iv)

(21) විසිතුරු පටි වියා ගැනීම සඳහා භාවිතා කරන ක්‍රමයකි, හැඩ පෙති ගෙතීම. හැඩ පෙති ආධාරයෙන් වියාගත හැකි පටි වර්ග සහිත පිළිතුර තෝරන්න.

(1) ඉන පටි, හවඩි පටි, හත් පටි (2) ඉන පටි, ගවුම් පටි, ඔරලෝසු පටි

(3) ඉන පටි, හම් පටි, නෙරි පටි (4) ඉන පටි, හවඩි පටි, නෙරි පටි

(22) පහත දැක්වෙන වියමන් රටා කිහිපයක් සඳහා නූල් අදින ආකාරයයි. ඒ අනුව තුඩු හීරි වියමන සඳහා නූල් අදින ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.



(i) (ii) (iii) (iv)

(23) 3/3, 1/2 යන සංයෝජිත හීරි වියන වියා ගැනීම සඳහා අවශ්‍ය වන පුඩුවැල් පේළි සංඛ්‍යාව වන්නේ,

(1) 4 කි. (2) 5 කි. (3) 6 කි. (4) 9 කි.

(24) කමිස රෙදි හැදයක් වියා ගැනීම සඳහා සෙන්ටිමීටරයකට දික් නූල් 40 ක් ද පළල සෙන්ටිමීටර 45 ක් ද යොදා ගෙන ඇත. එම හැදයේ දික් නූල් සංඛ්‍යාව කොපමණද?

(1) 1600 කි. (2) 1400 කි. (3) 1800 කි. (4) 2000 කි.

(25) නූල් කැරල්ලක දිග මීටර් 1000 කි. නූල් කැරලි 10 ක දිග මීටර් කොපමණද?

(1) මීටර් 5000 කි. (2) මීටර් 10, 000 කි. (3) මීටර් 1000 කි. (4) මීටර් 20, 000 කි.

(26) ස්වභාවික හේතූන්ගේ බලපෑමෙන් හා භෞතික, රසායනික සහ ජීව විද්‍යාත්මක බලපෑම්වලට ලක්ව පාෂාණ ජීරණය වී මැටි නිර්මාණය වේ. මෙම මැටි හඳුන්වන විද්‍යාත්මක නාමය වන්නේ,

(1) පෙල්ස්පාර් (2) ඇලුමිනා ඔක්සයිඩ් (3) ඇලුමිනා සිලිකේට් (4) ඇලුමිනා ඩයොක්සයිඩ්

(27) වැසි, සුළං, ගංගා, ඇලදොළ ආදී ජල ප්‍රවාහ මගින් ජීරණය වූ ස්ථානයක සිට වෙනත් ස්ථානයක තැන්පත් වන මැටි හඳුන්වන්නේ,

(1) ප්‍රාථමික මැටි (2) ද්විතීයික මැටි (3) රතු මැටි (4) කළු මැටි

(28) යකඩ ප්‍රතිශතය ඉතාමත් සුළු වශයෙන් අඩංගු සුදු වර්ණයෙන් යුතු පිළිස්සීමෙන් පසුද සුදු පැහැයක් ගන්නා මැටි වර්ගය වන්නේ,

(1) බෝල මැටි (2) අගම් මැටි (3) රතු මැටි (4) කෙඔලින් මැටි

(29) මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේදී සමාන හැඩ සහිත භාණ්ඩ රාශියක් නිපදවා ගැනීමට සුදුසු නිෂ්පාදන ක්‍රමය වන්නේ,

(1) සකපෝරු භාවිත කිරීමයි. (2) අච්චු භාවිත කිරීමයි.

(3) දරණු භාවිත කිරීමයි. (4) තහඩු භාවිත කිරීමයි

(30) සකපෝරුවේ භාණ්ඩයක් ඉදි කිරීමේදී මැටි පිඩ මධ්‍යගත කිරීම සිදු කරන්නේ කිනම් අවස්ථාවේද?

(1) පළමු අවස්ථාවේදී (2) දෙවන අවස්ථාවේදී (3) තුන්වන අවස්ථාවේදී (4) හතරවන අවස්ථාවේදී

(31) මහා පරිමාණ කම්හල්වල ඉතා උසස් තත්වයේ මැටි භාණ්ඩ පිළිස්සීම සිදු කරයි. මේ සඳහා භාවිතකරන පෝරණු කාණ්ඩය තෝරන්න.

(1) යටි දහර පෝරණුව, රෝලර් පෝරණුව (2) දෝන පෝරණුව, රෝලර් පෝරණුව

(3) උඩු දහර පෝරණුව, දෝනා පෝරණුව (4) ආවරක පෝරණුව, යටි දහර පෝරණුව

(32) පහත රූප සටහනින් දක්වෙන මැහුම් ක්‍රමය වන්නේ,



(1) බ්ලැන්කට් මැස්ම (2) දම්වැල් මැස්ම

(3) හුරුළු කටු මැස්ම (4) ලේසි ඩේසි මැස්ම

(33) රිබන් එම්බ්‍රොයිඩර් සඳහා අත්‍යාවශ්‍ය උපකරණයකි.

(1) රාමුව (2) රිබන් ඉඳිකටුව හා ස්ට්‍රැප්ස්ටි ඉඳිකටුව

(3) අයිඩා රෙදි (4) රිබන් කටුව හා ගෙතුම් කටුව

(34) සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණයේදී පතරොම අත්‍යාවශ්‍යය. එහිදී අපට අවශ්‍ය ප්‍රමාණයට පතරොම විශාල කිරීමට යොදා ගන්නා සරලම ක්‍රමය වන්නේ,

(1) කොටු දැලක් ඇඳ මිමි අනුව විශාල කිරීම

(2) අඩි කෝදුවෙන් මැන ප්‍රමාණ ඇඳීම

(3) කවකටුවෙන් ගෙන මිමි ලබා ගැනීම

(4) ඡායා පිටපත් ගෙන විශාල කිරීම



(35) ඉහත පතරොම අදාළ වන්නේ,

(1) හාවා මැසීමටය (2) බලු පැටියා මැසීමටය. (3) බෝනික්කා මැසීමටය. (4) පෙන්ගුවින් මැසීමට ය.

(36) සෙල්ලම් සතුන් නිර්මාණය සඳහා සුදුසු රෙදි වර්ගය වන්නේ,

(1) පොප්ලින් රෙදි (2) මස්ලින් රෙදි (3) ෆෙල්ට් රෙදි (4) ජෝජට් රෙදි

(37) පේපර් ක්විලින් නිර්මාණවල උසස් බව රඳා පවතින සාධකය කුමක්ද?

(1) කඩදාසි වර්ගය අනුව (2) වර්ණ ගැලපීම හා ක්‍රමානුකූල බව

(3) කඩදාසි මිල අනුව (4) කඩදාසිවල වර්ණය අනුව

(38) ඉවත දමන කඩදාසි වලින් ඉතා අලංකාර ලෙස ආභරණ සකස් කරයි. එම ආභරණ කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට යොදා ගන්නා ආලේපනය කුමක්ද?

(1) ලැකර් තීන්ත ආලේපනය (2) ඉමල්ෂන් තීන්ත ආලේපනය (3) වාර්නිෂ් ආලේපනය (4) වර්ණ ආලේපනය

(39) උසස් නිමාවෙන් යුතු ආකර්ශණීය සැහැල්ලු සෙල්ලම් භාණ්ඩවලට වෙළඳපොලේ හොඳ ඉල්ලුමක් ඇත.'' ටෙඩි බෙයාර්'' ඉතා ජනප්‍රිය සෙල්ලම් සතෙකි. එම සතා සෑදීමට අවශ්‍ය කොටස් ගණන කීයද?

(1) හතරකි (2) පහකි (3) හයකි (4) හතකි

(40) සුරතල් සතකු නිර්මාණය කිරීමට අවශ්‍ය කොටස් මසා ගැනීම සඳහා මූලිකව යොදා ගන්නා මැහුම් ක්‍රමයක් වන්නේ,

(1) පිස්මේන්තු මැස්ම (2) දම්වැල් මැස්ම (3) හුරුළු කටු මැස්ම (4) බ්ලැන්කට් මැස්ම